# 6.2 ඇමරිකානු නිදහස් සටන
## (අභ්‍යාස)



Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

විෂයය :- යුරෝපා ඉතිහාසය
පාඩම :- ඇමරිකානු නිදහස් සටන

( 01.) I බ්‍රිතාන්‍යය හැර ඇමරිකානු ජනපද පිහිටුවීම මුල් වූ රටක් නම් කරන්න. (ලකුණු 01)

II ඇමරිකාවේ ජීවත් වූ ස්වදේශික ගෝත්‍ර ජන කණ්ඩායම් තුනක් නම් කරන්න. (ලකුණු 03)

III යුරෝපා ජාතීන් ඇමරිකාවට සංක්‍රමණය වීමට බලපෑ දේශපාලන හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

IV එංගලන්තය යටතේ ඇමරිකානු ජනපද පාලනය වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 07)

( 02.) I ඇමරිකානු නිදහස් සටන යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

II ඇමරිකානු ජනපදවල ක්‍රියාත්මක වූ වාණිජවාදී ප්‍රතිපත්තිය තුළ අන්තර්ගත වූ කරුණු තුනක් ලියන්න. (ලකුණු 03)

III ප්‍රථම මහද්වීපික සමුළුවට සහභාගී වූ නායකයන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

IV යුද්ධයෙන් ඇමරිකානු ජනපදිකයන්ට ජයග්‍රහණය හිමි වීමට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

1. ඇමරිකානු කොඩියේ ඉරිවලින් සංකේතවත් වන්නේ කුමක් ද?

2. ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා නම් කරන්න.

3. 1767 දී ජනපද වාසීන්ගෙන් වීදුරු, ටින්, තේ, කඩදාසි, සායම් වර්ග සඳහා බදු අය කිරීමට පදනම් වූ පනත කුමක් ද?

4. බොස්ටන් වරායට තීරු බදු නිලධාරීන් පත් කිරීමට විරුද්ධව කරනු ලැබූ උද්ඝෝෂණවලට නායකත්වය දෙන ලැබුවේ කවුරුන් විසින් ද?

5. ඇමරිකන් ජනපද හා බ්‍රිතාන්‍යය අතර ඇති වූ යුද්ධ සඳහා ආධාර ලබා දුන් රටවල් දෙකක් නම් කරන්න.

අන්තර්ගතය :- එච්. ජී. ඉන්ද්‍රා කුමාරි මිය, ගුරු උපදේශිකා - දෙනුවර කලාපය.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී. එම්. මොරගොඩ මයා. ජාතික. තරුණ සේවා සභාව. (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk